නුඹලාගේ නිවෙස් මිනීවලවල් බවට පත්කර නො ගන්න. මාගේ මිනීවල සැමරුමක් බවට පත්කර නො ගන්න. මා වෙත නුඹලා සලවාත් (ආශිර්වාද) පවසන්න. හේතුව සැබැවින්ම නුඹලා පවසන සලවාතය නුඹලා කවර ස්ථානයක සිටිය ද මා වෙත ළඟා වනු ඇත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව
අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. "නුඹලාගේ නිවෙස් මිනීවලවල් බවට පත්කර නො ගන්න. මාගේ මිනීවල සැමරුමක් බවට පත්කර නො ගන්න. මා වෙත
නුඹලා සලවාත් (ආශිර්වාද) පවසන්න. හේතුව සැබැවින්ම නුඹලා පවසන සලවාතය නුඹලා කවර ස්ථානයක සිටිය ද මා වෙත ළඟා වනු ඇත." [حسن] [رواه أبو داود]

නිවෙස් සලාත් ඉටු නොකරන මිනිවලවල් මෙන් සලාත් ඉටු නොකර ඒවා අත්හැර දැමීමෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ වැළැක්වූහ. පුරුද්දට මෙන් එතුමාණන්ගේ මිනී වල නිතර නිතර බැහැදැකීමෙන් හා ඒ අසල රැස්වීමෙන් එතුමාණෝ වැළැක්වූහ. හේතුව සැබැවින්ම එය දේව ආදේශය වෙත යොමු කළ හැකි මාධ්යයක් වන බැවිනි. මහපොළොවේ කොතැනක සිටියත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත සලවාත් හා සලාම් පැවසීමට නියෝග කර ඇත. සැබැවින්ම එය සමීපයෙන් වූවත් දුරින් වූවත් එක හා සමානව එතුමාණන්ට ළඟා වනු ඇත. එබැවින් එතුමාණන්ගේ මිනීවල වෙත යෑමට අවශ්ය වන්නේ නැත.

http://www.sunnah.global/hadeeth/si/show/3350